Australian Government

Department of Health

## COVIDSafe ඇප් එක සම්බන්ධයෙන් ඔබ දැනගත යුතු දේ:

දැනටමත් මිලියන 5 කට ආසන්නවූ ඕස්ට්‍රේලියානුවන් COVIDSafe ඇප් එක ලබාගෙන ඇත. ජංගම දුරකථනයක් ඇති සියළුම ඕස්ට්‍රේලියානුවන් විසින් ඇප් එක ලබාගෙන කොරෝනා වයිරස් ව්‍යාප්තිය පැතිරීම අඩුකර සීමා ලිහිල් කිරීමට උපකාර කරන ලෙස ඉල්ලා සිටී.

## COVIDSafe ඇප් එක යනු කුමක්ද?

The COVIDSafe ඇප් එක යනු ඕස්ට්‍රේලියාවේ කොරෝනා වයිරසය පැතිරීම අඩු කිරීමට උපකාර කරන නව මහජන සෞඛ්‍යය මෙවලමකි. මේ මගින් කොරෝනා වයිරස් ආසාදිත අයෙකු සමග සම්බන්ධවූ අය හට ඒ බව දැනුම්දීමේ ක්‍රියාවලිය වේගවත් කෙරේ. මෙය යහපත් සනීපාරක්ෂක පුරුදු අනුගමනය කිරීම සහ ශාරීරික දුරස්ථභාවය මෙන්ම ජනගහණය වැඩිපුර පරීක්ෂා කිරීමට අමතරවවූ මෙවලමකි.

ඔබගේ දිනපතා කටයුතු සිදු කරන අතර ඔබගේ දුරකථනයේ මෙම ඇප් එක ක්‍රියාත්මකවේ. එය ඇප් එක ඇති වෙනත් දුරකථන සොයා ගැනීම සඳහා බ්ලූටූත් භාවිතා කරන අතර දිනය, වේලාව, දුර සහ සම්බන්ධවන අය සමග සම්බන්ධව සිටි කාලය වාර්තා කරනු ඇත. ඇප් එක මගින් ඔබ සිටින ස්ථානය වාර්ත නොකරනු ඇත. ඔබ මීටර 1.5 ක් ඇතුලත මිනිත්තු 15 ක් හෝ ඊට වැඩි කාලයක් සම්බන්ධවන උපකරණ සටහන් කර ගනී.

මෙම තොරතුරු සංකේතගත කර ඔබගේ දුරකථනයේ තැන්පත් කරනු ඇත. ඔබට වුවද මෙම තොරතුරු සඳහා ප්‍රවේශය නැත.

සම්බන්ධතා තොරතුරු දින 21 ක් පමණක් තැන්පත් කර තබන අතර ඉන්පසු ස්වයංක්‍රීයව මකා දමනු ඇත. මෙම කාලය වයිරසයේ දින 14 ක උපරිම බීජෞෂණ කාලයකට, සහ ආසාදනයක් ඇති බවට පරීක්ෂාවකින් සනාථ කර ගැනීමට යන කාලය ඇතුලත්වේ.

## ඇප් එක දුරකථනයේ ස්ථාපනය කර ගන්නේ කෙසේද?

ඇප් ස්ටෝරය වෙතින් ඇන්ඩ්‍රොයිඩ් සහ iOS දුරකථනවල ස්ථාපනය කර ගත හැකිවේ. ඇප් එක නොමිළේ ලබගත හැකි අතර ලබා ගැනීම ස්වේච්ඡාවෙන්වේ.

ලබාගැනීමෙන් අනතුරුව, නම, දුරකථන අංකය, පෝස්ට්කෝඩය සහ වයස් පරාසය ලබාදීම මගින් ලියාපදිංචිකල හැකිවේ.

COVID-19 තවදුරටත් අවදානමක් ඇති නොකරන විට, COVIDSafe ඇප් එක ඔබ දුරකථනයෙන් මකා දමන ලෙසට ඔබට මතක් කරනු ඇත. මේ මගින් ඇප් එකෙහි තැන්පත් කර ඇති සියළුම තොරතුරු මකා දමනු ඇත.

## ප්‍රජාව ආරක්ෂා කිරීමට COVIDSafe උපකාර කරන්නේ කෙසේද?

ඔබට COVID-19 ඇති බවට හඳුනාගතහොත්, ඔබ මෑතකාලීනව සම්බන්ධවූ සියළුම අයගේ තොරතුරු සෞඛ්‍යය බලධාරීන් විසින් ඉල්ලා සිටිනු ඇත. ඔබ ඇප් එක ලබාගෙන ඇතිනම්, ඇප් එකෙහි ඇති තොරතුරු වෙත ප්‍රවේශවීමට සෞඛ්‍යය බලධාරීන් හට අනුමැතිය ලබාදිය හැකිය (මෙහි ඔබ හා සමීපව සම්බන්ධවුනු අය සම්බන්ධ වාර්තා ඇත). මේ මගින් සෞඛ්‍යය බලධාරීන් හට ඔබ හා සම්බන්ධවූ අය හා වේගවත්ව සම්බන්ධවිය හැකි අතර වයිරසය පැතිරීම වැළැක්විය හැකිවනු ඇත.

**තොරතුරු භාවිතා කරන්නේ කවුරුන් විසින්ද?**

ඔබගේ ප්‍රාන්ත හෝ ටෙරිටරි රජයේ සෞඛ්‍යය බලධාරීන් හට පමණක් මෙම තොරතුරුවලට ප්‍රවේශවිය හැකිය. ඒ මගින් ඔබට පහත තොරතුරු ලබාදිය හැකියඃ

- බැලිය යුත්තේ කුමන කරුණුද
- ඔබ නිරෝධායනය විය යුතුද යන බව
- පරීක්ෂා කර ගන්නේ කෙසේද, කවදාද සහ කොතැනදීද යන්න, සහ
- ඔබ සහ ඔබගේ පවුලේ අය සහ මිතුරන් ආරක්ෂා කර ගන්නේ කෙසේද.

## COVID-19 සම්බන්ධ වැඩිදුර තොරතුරු

නිල මාර්ග ඔස්සේ පමණක් තොරතුරු ලබා ගැනීම වැදගත්වේ. australia.gov.au වෙබ් අඩවිය වෙත යන්න, දුරකථන අංක 1800 020 080 ඔස්සේ ජාතික කොරෝනා වයිරස් උපකාර මාර්ගය අමතන්න, නැතිනම් දුරකථන අංක 131 450 ඔස්සේ පරිවර්තන සහ තෝල්ක සේවාව අමතන්න.